මගේ අංකය -අධිසේ.කොා.ස/ලිපිකරු/III ශ්‍රේණිය (සීමිත)බගැ- 2025

සියළුම විභාග අපේක්ෂකයින් වෙත,

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සේවයේ අධිකරණ ලිපිකරු III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගයේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා කඩඉම් ලකුණු නිකුත් කිරීම - 2025

උක්ත සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ කඩඉම් ලකුණු මට්ටම 109 ක් (සෑම විෂයයකට ලකුණු 40 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත්) ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

02. ලකුණු 109 ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගෙන ඇති අයදුම්කරුවන් (ප්‍රතිඵල ලේඛනයේ අනු අංක 01 සිට 610 දක්වා) 2026.11.21 දින පෙ.ව.09.00 ට **කොළඹ මහාධිකරණ පරිශ්‍රයේදී** පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

03. ඒ සඳහා සහභාගිවීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන් පහත දැක්වෙන ලේඛනවල මුල් පිටපත් සමඟ ඒවායේ සහතික කර ගන්නා ලද ඡායාස්ථික පිටපත් පහත සඳහන් අනුපිළිවෙලට සකස්කර රැගෙන ආ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පත
iii. අධ්‍යාපන සහතික හා වෙනත් සහතික
iv. මුල් පත්වීමේ දින සිට දැනට දරණ තනතුර දක්වා පත්වීම් ලිපි සහ එම තනතුරු වල සේවය ස්ථිර කිරීමේ ලිපි (අනියම් පත්වීම් හැර)
v. කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් බවට සහතික
vi. මුල් පත්වීමේ දින සිට සේවක මහතා/මහත්මිය විසින් උපයා ගෙන ඇති වැටුප් වර්ධක සම්බන්ධ විස්තර ඉදිරිපත් කළ යුතුය.
vii. සේවා සහතිකය (සක්‍රීය හා සතුටු දායක සේවා කාලය ඇතුලත්)
viii. පහත සඳහන් කරුණු තහවුරු කිරීම සඳහා වූ සහතිකයක්

- අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ වසර 03ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තනතුරේ ස්ථිර කර ඇති සේවකයෙකු වීම

  හෝ

- අධිකරණවල කාර්යාල සේවක සේවයේ සේවා කාලය ද ඇතුළුව වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත තනතුරේ ස්ථිර කර ඇති අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ සේවකයෙකු වීම

  හෝ

- අධිකරණ වල කාර්යාල සේවක සේවයේ ඡෝෂක හා ප්‍රවේශක/සිතාසි හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා/පියකල් පියන්/ භාරකාර මාතා/අධිකරණ ආරක්ෂක සේවයේ නියුතු වසර 05 ක සක්‍රීයා හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තනතුරේ ස්ථිර කර ඇති සේවකයෙකු වීම

04. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් ගෙවනු නොලැබේ.

05. **මෙම දැන්වීම මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා කරන කැඳවීම් ලිපිය වන අතර, වෙනත් කැඳවීමේ ලිපියක් නිකුත් කරනු නොලැබේ.**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2026 නොවැම්බර් මස 05 දින
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12